සැ. යු. - 2023.12.16 දින පළ වූ අංක 2311 දරන *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවී ය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,312 - 2022 දෙසැම්බර් මස 23 වැනි සිකුරාදා - 2022.12.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 886 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 888 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2023 ජනවාරි මස 13 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 දෙසැම්බර් මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## වාණිජ මහාධිකරණයේ දී ය

## ප්‍රසිද්ධ ඉඩම් වෙන්දේසියයි

වාණිජ මහාධිකරණයේ
නඩු අංක : CHC/221/2015/MR

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී,
අංක 21, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත,
කොළඹ 01 සහ කොළඹ 13, ජෝර්ජ් ආර්. ද සිල්වා මාවතේ අංක 198 දරන ස්ථානයේ ''කොටහේන ශාඛාව'' යනුවෙන් සඳහන් කරන හා හඳුන්වනු ලබන ශාඛා කාර්යාලයක් සහ හෝ ව්‍යාපාර ස්ථානයක් ඇත්තේ ය.

*...................පැමිණිලිකරු.*

*එදිරිව*

1. කලම්බෝ මෙරයින් (ප්‍රයිවෙට්) ලිමිටඩ්,
   අංක 78/4, වික්‍රමසිංහපුර, බත්තරමුල්ල.

2. ශාන්ත කුමාර තේනුවර,
   අංක 78/2, වික්‍රමසිංහපුර, බත්තරමුල්ල.

*...................විත්තිකරුවෝ.*

මේ උකස් නඩුවේ කාර්යය සඳහා කොළඹ 10, මරදාන, පන්සල පාරේ, අංක 216 දරන ස්ථානයේ නැසීගිය ලලිතා සෙල්ලහේවාගේ බූදලයේ යථා පරිදි පත්කරන ලද නීත්‍යානුකූල නියෝජිතගේ තත්ත්වයෙනි.

ඉහත වාණිජ මහාධිකරණයේ නඩුවේ අංක CHC/221/2015/MR නඩුවේලා ඇතුළත් කරන ලද සමථ කොන්දේසි ප්‍රකාරව, පැමිණිලිකරු සහ 1 වන හා 2 වන විත්තිකරුවන් විසින්, මෙම නඩුව සමථයට පත්වූ බවට දෙපාර්ශවය එකඟව අධිකරණයට දන්වා සිටින හෙයින්, ඒ අනුව ඒ වෙන් වෙන්ව 1 වන හා 2 වන විත්තිකරුවන්ට විරුද්ධව පැමිණිලිකරුගේ වාසියට නඩු තීන්දුව ඇතුළත් කරනු ලබන බවට මෙයින් අණ කොට තීන්දු ප්‍රකාශ කරනු ලැබේ. එනම්

(අ) රු. 7,122,207.32 ක සමස්ථ මුදලක් රු. 6,686,080/-ක් වූ ඉතිරි ප්‍රාග්ධන මුදල මත 2012 ජූලි මස 01 වන දින සිට ඒ මුදල සම්පූර්ණයෙන් හා අවසාන වශයෙන් බේරුම් කරනු ලබන තෙක් වර්ෂයකට 15%ක පොළියක් ද සමග අයකර දෙනු ලබන බවට මෙයින් අණ කොට තීන්දු ප්‍රකාශ කරනු ලැබේ.

(ආ) මෙහි වූ උපලේඛනයේ විස්තර කර ඇති මාර්ග අයිතිවාසිකම් ද, සමග ඉඩම් හා පරිශ්‍රයන් ද එකී ඉඩම් හා පරිශ්‍රයන් මත පිහිටි සියලු දේ ද, ආකාරයෙන් එකී සමථ කොන්දේසි ප්‍රකාරව මෙමෙ නඩුව සමථයට පත් වූ බවට මෙයින් අණකොට තීන්දු ප්‍රකාශ කරනු ලැබේ. වර්ෂ 2017ක් වූ සැප්තැම්බර් මස 29 වැනි දින මෙම නඩුවේ තීන්දුව ප්‍රකාරව පැමිණිල්ලේ අයැදීමේ අයැද ඇති පරිදි එක්ව හා එකී ඉඩම් හා පරිශ්‍රයන් සම්බන්ධයෙන් 1 වන හා 2 වන විත්තිකරුවන්ගේ සියලු අයිතිවාසිකම් හා හිමිකම් ද, මේ නඩුවේ ඇතුළත් කරනු ලබන තීන්දු ප්‍රකාශය ඉටු කිරීම පිණිස පැමිණිලිකරු විසින් නීත්‍යානුකූලව තහනමට ගෙන විකිණිය හැකි විත්තිකරුවන්ගේ වෙනත් යම් දේපළ ද සමග, පිළිවෙලින් "C1", "C2" හා "C3" වශයෙන් සළකුණු කරන ලද අංක 3733 හා 2005 සැප්තැම්බර් මස 14 වැනි දින දරන උකස් බැඳුම්කරය, අංක 1714 හා 2006 අප්‍රේල් මස 26 වැනි දින දරන උකස් බැඳුම්කරය, අංක 5527 හා 2007 ජූලි මස 24 වැනි දින දරන උකස් බැඳුම්කරය යටතේ හා ඒ ප්‍රකාරව සහ ඒවා ක්‍රියාත්මක වීමෙන්, ඉහත කී මුදල් අයකර ගැනීම සඳහා බැඳී පවත්නා බවට හා ක්‍රියාවේ යෙදවිය හැකි බවට මෙයින් අණ කොට තීන්දු ප්‍රකාශ කරනු ලැබේ.

(ඇ) "C1" හා "C3" වශයෙන් සළකුණු කරන ලද ඉහත කී උකස් බැඳුම්කර ක්‍රියාවේ යෙදවීමේ ලා මෙහි වූ එකී උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් හා පරිශ්‍රයන් විකිණීමෙන් ලැබෙන මුදල් තීන්දු ප්‍රකාශිත මුදල ඉටු කිරීමට ප්‍රමාණවත් නොවන්නේ නම්, මේ නඩුවේ ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය යටතේ අයවීමට තිබෙන මුදල් අයකර ගැනීම පිණිස, නීත්‍යානුකූලව තහනමට ගෙන විකිණිය හැකි 1 වන සහ හෝ 2 වන විත්තිකරුවන්ගේ වෙනත් යම් දේපළ තහනමට ගෙන විකිණීමට පැමිණිලිකරු හිමිකම් ලබන බවට මෙයින් අණකොට තීන්දු ප්‍රකාශ කරනු ලැබේ.

(ඈ) තීන්දු ප්‍රකාශයේ දිනයේ සිට මාස 2ක් ඇතුළත, අධිකරණය විසින් තීන්දු ප්‍රකාශිත පරිදි, ඉහත සඳහන් මුදල්, පොළිය හා නඩු ගාස්තු ගෙවීම පැහැර හරිනු ලැබීමේ දී, මෙහි වූ එකී උපලේඛනයේ විස්තර කර ඇති මාර්ග අයිතිවාසිකම් ද සමග එකී ඉඩම් හා පරිශ්‍රයන්, එහි ලා හා එයට අයත් විත්තිකරුගේ සියලු අයිතිවාසිකම්, හිමිකම් හා සම්බන්ධතා ද අධිකරණය විසින් පත් කරන ලද වෙන්දේසිකරුවකු මගින්, ප්‍රමාණවත් යයි ඒ වෙන්දේසිකරු සලකන යථා පරිදි දැන්වීමකින් පසුව, අධිකරණය විසින් අනුමත කරන ලද විකිණීමේ කොන්දේසි මත, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලෙස මෙයින් අණකොට තීන්දු ප්‍රකාශ කරනු ලැබේ.

(ඉ) එකී වෙන්දේසිකරුට, එකී උකස් කරන ලද දේපළ පළමුව එහි තක්සේරු කරන ලද වටිනාකමේ මුදලට විකිණීම සඳහා ඉදිරිපත් කරන ලෙසට සහ ඒ වටිනාකමේ මුදලට ලංසු තබන්නන් කිසිවකු නොවුවහොත්, අධිකාරය නිකුත් කරන ලද අවස්ථාවේ දී තීන්දු ප්‍රකාශය යටතේ අයවීමට තිබුණු මුදලට, ඒ විකිණීමේ දී ද ලංසු තබන්නන් කිසිවකු නොවන්නේ නම්, එවිට, ඉනික්බිතිව ම සිටින ඉහල ම ලංසු තබන්නා වෙත විකිණීම සඳහා ඉදිරිපත් කරන ලෙසට සහ ඒ විකිණීමේ දී පැමිණිලිකරුට හෝ පැමිණිලිකරු වෙනුවෙන් වෙනත් තැනැත්තකුට එකී උකස් කරන ලද දේපළ සඳහා ඒ තක්සේරු කරන ලද වටිනාකමේ මුදලට හෝ ඊට ඉහලින් හෝ එකී තීන්දු ප්‍රකාශයේ එකී මුදලට යන මේ දෙකින් වඩා අඩු මුදලට ලංසු තබා මිල දී ගැනීමට ඉඩදෙන ලෙසට සහ පැමිණිලිකරු එහි ගැනුම්කරු වී නම්, පැමිණිලිකරුගේ හිමිකම් පෑමේ පොළියේ හා නඩු ගාස්තුවල ප්‍රමාණය හිලවු කර ගැනීමට පැමිණිලිකරුට ඉඩදෙන ලෙසට, විධාන කර බලය දෙනු ලබන බවට මෙයින් අණ කොට නියෝග කර ඇති බැවින් ද එකී නියත තීන්දු ප්‍රකාශය අනුව පැමිණිලිකරු ගෙවීම් කිරීමට ඉහත නම් සඳහන් විත්තිකරුවන් පැහැර හැර අපොහොසත් වී ඇති හෙයින් ද,

එකී නඩුවේ නියත තීන්දු ප්‍රකාශය ඉටු කිරීමට ඉහත 1 වන හා 2 වන විත්තිකරුවන් අපොහොසත් වී පැහැර හැර ඇති හෙයින්, එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති බලපත්‍රයේ බලය පිට ඉහත නම් සඳහන් විත්තිකරුවන්ට අයත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපල වූ, පර්චස් 10.95ක් ද, සහ පර්චස් 9.05ක් වූ ''සෙන්ට් තෝමස් වත්ත'' යනුවෙන් හඳුන්වන ඉඩම් කැබැල්ල හා ඒ මත පිහිටි ගොඩනැගිලි හා වෙනත් සියලු දේ **වර්ෂ 2023ක් වූ ජනවාරි මස 07 වැනි දින පෙ.ව. 11.30ට** ඉහත නම් සඳහන් විත්තිකරුවන්ගේ බත්තරමුල්ල, වික්‍රමසිංහපුර, අංක 78/4 හි දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

*පිවිසුම.*- මේ සඳහා ප්‍රවේශය බත්තරමුල්ල, පැලවත්ත - පන්නිපිටිය පාරේ තලවතුගොඩ හංදියට මීටර් 500කට මෙපිටින් වම් දෙසින් පිහිටි වික්‍රමසිංහපුර පාර ඔස්සේ කි. මී. 1ක් ගියපසු හමුවන ස්වාධීන රූපවාහිනී සංස්ථාව පසුකරනවාත් සමගම දකුණට ඇති පාර ඔස්සේ මීටර් 10ක් පමණ ගිය විට වම් පසින් මෙම දේපල හමුවෙනු ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය. (චෙක්පත් භාරගනු නොලැබේ.)

1. විකුණුම් මිලෙන් 25% (සියයට විසිපහක්)
2. වෙන්දේසිකරුගේ වෘත්තීය ගාස්තු (ගැනුම් මිලෙන්) 2.5% (සියයට දෙකයි දශම පහයි)
3. සියළුම ප්‍රචාරක ගාස්තු
4. මුද්දර ගාස්තු
5. ලිපිකරු හා සෝෂක ගාස්තු
6. ප්‍රාදේශීය සභා ගාස්තු 1%ක් (සියයට එකක්)
7. නොතාරිස් ගාස්තු
8. පළාත් පාලන ආයතනයන් විසින් පනවනු ලැබූ වෙනත් බදු ද ආදිය
9. ගැණුම් මිලෙන් පලමුවන රු. 7,500/-ට රු. 150/-ක් ද, ඊට අමතරව ලැබෙන සෑම රු. 1,000/-ටම රු. 5/- බැගින් වූ අධිකරණයට ගෙවිය යුතු ගාස්තු ද, ඉතිරි 75%ක (සියයට හැත්තෑපහක්) මුදල දින 30ක් ඇතුලත කොළඹ වානිජ මහාධිකරණයේ නඩු අංක CHC/221/2015/MR දරන නඩුවේ බැරට තැන්පත් කළ යුතු අතර, එසේ ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත් මුලින් තැන්පත් කරන ලද මුදල් ආපසු නොගෙවන අතර එකී දේපල නැවත වෙන්දේසියේ තැබීමට ක්‍රියා කරනු ඇත.

විමසීම් හා අදල ඔප්පු ලේඛන පරීක්ෂාව සඳහා පහත නම සඳහන් අයව හමුවන්න.

අධිකරණයේ අණ පරිදි,

අජිත් දසනායක,
උසාවි කොමසාරිස්/සාමවිනිසුරු (මුළු දිවයිනටම)
බලයලත් වෙන්දේසිකරු සහ තක්සේරුකරු.

12-628

# විවිධ දැන්වීම්

## සී. ජිනසේන පදනම සංස්ථාපිත කිරීම සඳහා වූ පනතකි

උදයන සී. කිරිඳිගොඩ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 53 දරන ස්ථාවර නියෝග යටතේ "සී. ජිනසේන පදනම" සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

*(අ)* පරිසර සංරක්ෂණය හා ඊට අදාළ වන මහජනතාව දැනුවත් කිරීම, ස්වදේශ ශාක හා පැළෑටි නොනැසී පවත්වාගත හැකි ආකාරයේ සංරක්ෂණය කිරීම මගින් තිරසාර සංවර්ධනයට සහය වීම ;

*(ආ)* අධ්‍යාපනික තාක්ෂණික හා පුද්ගල සංවර්ධන යෝජනා මගින් තරුණ තරුණියන්ගේ ජීවන හා තාක්ෂණික කුසලතා වැඩිදියුණු කරගැනීමට හා විධායක හා ව්‍යවසායක ප්‍රජාවන්ට සහය වීම, උපකාර වීම ;

*(ඇ)* ප්‍රජා සේවාවන් ලබා දීම, විශේෂයෙන් රටේ ස්වභාවික හා මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් ඇතිවන ව්‍යසන, ආපදා, ජාතික හදිසි අවස්ථාවන්වලදී ජනතාවට සහය වීම, උපකාරී වීම.

උදයන සී. කිරිඳිගොඩ,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

12-450

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.